# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1707/6 - 2011 මැයි 23 වැනි සඳුදා - 2011.05.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එල්ආර්අයි-සීඩීපී/එස්ඩී/එම්/එස්2-2.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම් රජය විසින් අත්පත් කරගෙන ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගන්නා ලද ඉඩමේ විස්තර :

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලක්ෂපතිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 520210 හා 2011.04.26 දිනැති කැඩැස්තර සිතියමේ (කළාප 20න් 18 වැනි කලාපය) කැබලි අංක 217, 220, 221 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0025 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කොටස්.

01. **කැබලි අංක 217**
ඉඩමේ නම: බිෂොප් ටෙරස්, වරි. අංක 35/1; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් කියන අය: පී. එච්. විතාන, 31/1, බිෂොප්ටෙරස්, ලක්ෂපතිය, මොරටුව; ප්‍රමාණය: හෙක්. 0.0010.

02. **කැබලි අංක 220**
ඉඩමේ නම: බිෂොප් ටෙරස්, වරි. අංක 33ඒ; විස්තරය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: ආර්. සේනානායක, 33ඒ, බිෂොප්ටෙරස්, ලක්ෂපතිය, මොරටුව; ප්‍රමාණය: හෙක්. 0.0005.

03. **කැබලි අංක 221**
ඉඩමේ නම: බිෂොප් ටෙරස්, වරි. අංක 33ඒ; විස්තරය: සිමෙන්ති කාණුව; මුල් හිමිකම් කියන අය: ආර්. සේනානායක, 33ඒ, බිෂොප්ටෙරස්, ලක්ෂපතිය, මොරටුව; ප්‍රමාණය: හෙක්. 0.0010.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 ජුනි මස 28 යන දිනදී යථාකාලයේදී දැනුම් දෙනු ලබන පරිදි එකී නියමිත වේලාවට අංක 51, පිරිවෙන පාර, රත්මලාන, ලුනාව පරිසර ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි. .

තවද, 2011 ජුනි මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. වීරබාහු,
අත්කර ගැනීමේ නිලධාරී.

2011 මැයි මස 23 වැනි දින,
ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලය,
ලුනාව පරිසර ප්‍රවර්ධන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය,
51, පිරිවෙන පාර,
රත්මලාන.

06 - 125